**#mediaethicsSL #SinhalaPress #lka #SundayLankadeepa #January13**

ඉරිදා ලංකාදීප පුවත්පතේ 'තම කුසින් වැදූ දියණිය වත්තේ වළ දැමූ අම්මා කෙනෙක්' යන මැයෙන් පළවූ ලිපියක, එම සිදුවීමට අදාළව සැකපිට අත් අඩංගුවට ගත් සැකකරුගේ සහ සැකකාරියගේ ඡායාරූප, 'එම සැකකරුවන්ගේ අසරණ වූ දරුවන්' යන මැයෙන් බාලවයස්කාර දරුවන්ගේ ඡායාරූප පළ කොට තිබිණි. මෙහිදී කරුණු දෙකක් අපට අවධානයට ගත හැක. නීතියෙන් වරදකරුවන් කිරීමට පෙරාතුව සැකකරුවන්ගේ අනන්‍යතාවය හෙළිවන පරිදි ඔවුන්ගේ ඡායාරූප පළ කිරීම යෝග්‍ය වන්නේ යැයි ඔබ සිතන්නේද? එසේම බාලවයස්කාර දරුවන්ගේ අනන්‍යතාවයන් හෙළිවන පරිදි ඔවුන්ගේ ඡායාරූපයන් පළ කිරීම යෝග්‍ය වන්නේ යැයි ඔබ සිතන්නේද? මෙම ඡායාරූපයන් පළ කිරීම, මහජන ලැදියාවට අදාළ යැයි තර්ක කළ හැකිද?